www.kidworship.kr

# කුරුසිපත් වීම

-The Crucifixion-



137Page

**පොතේ ගුරා** දවසක්දා යේසුස්වහන්සේ තමුන්ගේ ගෝලයන් සමග ගෙත්සෙමනට ගියා.

**යේසුස්වහන්සේ** මෙතැන ඉන්න... බලා සිටින්න... මා එනතුරු යාච්ඤා කරන්න...

**පොතේ ගුරා** ගෝලයන්ට කතා කළාට පසුව යේසුස්වහන්සේ තවත් ටිකක් ඈතට ගොස් මුණින් වැටී යාච්ඤා කරන්නට වුණා.

**යේසුස්වහන්සේ** මාගේ පියාණෙනි, ඔබවහන්සේ කැමතිසේක් නම් මේ කුසලානය මාගෙන් පහ කළ මැනවි, එසේ වී නමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා.

**පොතේ ගුරා** යේසුස්වහන්සේ යාච්ඤා කළායින් පසුව උන්වහන්සේ මේ කුසලානය දැරීමට ශක්තිය ලබා ගත්තා. පසුව උන්වහන්සේ යාච්ඤාවෙන් නැගිට ගොස් නිදිබරව් සිටි ගෝලයන් කතා කළා.

**යේසුස්වහන්සේ** මා සමග පැයක්වත් අවදිව සිටින්නට නුඹලාට බැරි මන්ද? පරීක්ෂාවට නොපැමිණෙන ලෙස අවදිව සිට යාච්ඤා කරන්න.



138Page

**පොතේ ගුරා** යේසුස්වහන්සේ යාච්ඤා කොට වැඩි වෙලාවක් යන්නට මත්තෙන්, කඩු මුගුරු අතැතිව හේවායින් කණ්ඩායමක් සමගින් යූදස් ඉස්කාරියොත් පැමිණෙනවා. මේ වනවිටත් යූදස්, යේසුස්වහන්සේව උත්තම පූජකයන්ට සහ දේවමාළිගාවේ මුරකාරයන්ට, රිදී කාසි 30කට පාවා දෙන්නට එකඟ වෙලයි සිටියේ. යූදස් හේවායන්ට කතාකොට,

**යූදස්** මා විසින් යමෙකු සිඹින්නේද, ඒ යේසුස් ය.

**පොතේ ගුරා** යූදස් යේසුස්වහන්සේව සිපගත්තා. එකණෙහිම හේවායින් විත් යේසුස්-වහන්සේව අත්අඩංගුවට ගනු ලැබුවා.



139Page

**පොතේ ගුරා** පොතේ ගුරා යේසුස්වහන්සේගෙන් ප්‍රශ්ණ කළා.

**උත්තම පූජකයා** ඔබ කියන්නේ ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයා කියලද?

**යේසුස්වහන්සේ** මම දෙවියන්වහන්සේගේ පුත්‍රයා, මම මැරී නැවත නැගිටිනවා. එවිට මම දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ සිටනවාත්, නැවත මම වළාකුල්වලින් මෙහි පැමිණීමත් ඔබ දකින්නට යනවා.

**පොතේ ගුරා** උත්තම පූජකයා තරහින් කෑ ගහනවා.

**උත්තම පූජකයා** ඔබ දේව අපහාසයක් කරන්නේ කොහොමද ? ඔබ දඬුවම් ලබන්නම යනවා.

**පොතේ ගුරා** අන්තිමට උත්තම පූජකයෝ සහ නායකයන් උන්වහන්සේව පහත් කොට, උන්වහන්සේය මරණයට තීන්දු කරනවා. මිනිසුන් යේසුස්වහන්සේට කෙළ ගසා අපහාස කොට ගහනවා.



140Page

**පොතේ ගුරා** පසුදින උදෑසන උත්තම පූජකයන්, වැඩිමහල්ලන්, සහ ව්‍යවස්ථාව උගන්වන්නන් විසින් යේසුස්වහන්සේ ව ගැට ගසා පිලාත්ට බාර දුන්නා. ඔවුන් යේසුස්වහන්සේට විරුද්ධව බොරු සාක්ෂි දුන්නා. ඒත් යේසුස්වහන්සේ කිසිවක් කිවේ නෑ. එහෙත් යේසුස්වහන්සේ නිර්දෝෂි කෙනෙක් බව යේසුස්වහන්සේ දැනගෙන සිටියා. පාස්කු මංගල්‍යයේ දී එක් හිරකාරයෙක් නිදහස් කිරීම ඒ දිනවල පැවැති සිරිතක් ව තිබුණා. ඒ නිසා පිලාත් සෙනගගෙන් ඇසුවා.

**පිලාත්** මම කවුරුන් නිදහස් කරනවාට නුඹලා කැමතිද? බරබ්බස්ද? යේසුස්වහන්සේද?

**ජනතාව** බරබ්බස් ...! බරබ්බස් ...! නිදහස් කරන්න බරබ්බස් ...!

**පොතේ ගුරා** බරබ්බස් මිනීමරු චෝදනාවක් හේතුවෙන් හිරගෙයි දමා සිටි පුද්ගලයෙක්. ඒත් බරබ්බස් නිදහස් කරන්නැයි කියමින් මුළු සෙනග කෑ ගසන්න පටන් ගත්තා. මේ හේතුවෙන් නගරයේ කැරැල්ලක් ඇතිවේ යැයි පිලාත් බය වුණා.

**පිලාත්** හරි... නුඹලගේ කැමැත්ත මම කරන්නම්. ඒත් මේ මිනිසාගේ ලේ වලින් මම නිදොස්. නුඹලාම එහි වගකීම දරන්න ඕන.

**පොතේ ගුරා** අන්තිමට පිලාත් බරබ්බස් නිදහස් කරලා, යේසුස්වහන්සේට පහර දී, කුරුසිපත් කරන්න බාර දුන්නා.

---



141Page

**පොතේ ගුරා** හේවායන් ධවල (තද රතු) වස්ත්‍රයක් උන්වහන්සේට හඳවා, කටු ඔටුන්නක් සාදා උන්වහන්සේගේ හිසේ දමනවා. මුගුරක් උන්වහන්සේගේ අතට දී උන්වහන්සේ දණ ගස්වා, ඔවුන් අපහාස කරනවා.

**හේවායෝ** හේ .. හේ .. යුදෙව්වන්ගේ රජතුමනි !!

**පොතේ ගුරා** හේවාගේ ධවල වස්ත්‍රය ගළවා, යේසුස්වහන්සේගේ ඇඳුම් හඳවා කුරුසිපත් කරන ස්ථානයට රැගෙන යනවා. උන්වහන්සේ කුරුසිය ගෙන ගොල්ගොතාවලට යනවා. ඒත් කුරුසියේ බර වැඩි නිසා උන්වහන්සේ වැටෙනවා.

**හේවායො** කරන්න.. මේ දැන්මම... නවතින්න හිතන්නවත් එපා..

**පොතේ ගුරා** කිරේනියේ සීමොන් නම් මිනිසෙක් ඒ අසල සිටියා. උන්වහන්සේගේ කුරුසිය උසුලගෙන ගෙනෙන පිණිස ඔවුහු කිරේනියෙ සීමොන් ට බල කළා.



142Page

**පොතේ ගුරා** යේසුස්වහන්සේ අන්තිමට ගොල්ගොතාවලට ආවා. සොල්දාදුවන් උන්වහන්සේගේ ඇඳුම් ගළවනවා. උන්වහන්සේගේ දෑත් සහ දෙපා කුරුසිය මත තබා ඇණ ගසා කුරුසිපත් කරනවා. සොල්දාදුවන් උන්වහන්සේගේ ඇඳුම් කවුද ගන්නේ, මොන කොටසද ගන්නේ, කියා බෙදාගන්න පිණිස දාදු දමනවා. උන්වහන්සේගේ හිසට උඩින් කුරුසියේ මුදුනත "යුදෙව්වන්ගේ රජ මොහුය" කියා දැන්වීමක් ලියා තැබුවා. යේසුස්වහන්සේ ඒ වේදනාව තුළින් කතා කරනවා.

**යේසුස්වහන්සේ** පියාණෙනි..., ඔවුන්ට සමාව දෙන්න..., ඔවුන් දන්නේ නෑ, ඔවුන් කරන්නේ කුමක්ද කියා...

---



143Page



144Page

**පොතේ ගුරා** මුළු රට පුරා අන්ධකාරයක් පතිත වුණා. යේසුස්වහන්සේ මහත් ශබ්දයකින් මොර ගසා,

**යේසුස්වහන්සේ** "මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මක්නිසාද?"

**පොතේ ගුරා** යේසුස්වහන්සේගේ පොළොවේ කාලය දැන් අවසානයට ළඟා වී ඇති බව උන්වහන්සේ දැන සිටියා. නිහඬව, ඉතා සෙමින්, උන්වහන්සේ අන්තිම වචන ටික කීවා.

**යේසුස්වහන්සේ** සියල්ල නිම වුණා.

**පොතේ ගුරා** ඒ සමඟම යේසුස්වහන්සේ හිස නමා, ආත්මය හළ සේක. ඒ වෙලාවේ දේව මාළිගාවේ තිරය ඉහළ සිට පහළට දෙකඩව ඉරී ගියා.. පොළොව කම්පා වුණා.. පර්වත බිඳුණා.. සොහොන් ගෙවල් ඇරුණා. යේසුස්වහන්සේ ... දෙවියන්වහන්සේගේ පුත්‍රයා ලෝකයේ පව් උදෙසා මැරුණා.

**ජීවිතයට අදාල කිරිම** දුවේ පුතේ, අපි යේසුට ටිකක් කතා කරමු. "ආදර යේසුනි, අපේ පව් නිසා මරුණාට ස්තුතියි. ඔබවහන්සේ මගේ ගැළවුම්කරුවාණන් ලෙස මම පිළිගන්නවා. මේ කතාව මාව ගොඩක් දුකට පත් කළා. මාව ගළවගන්න මේ තරම් දෙයක් ඔබවහන්සේ කළාද? අනේ! ඒකට දෙන්න මා ළඟ වටිනා දේවල් නෑ. ඒත් මම ඔබවහන්සේට ගොඩක් ආදරෙයි. ඒක පිළිගන්න යේසුනි... මම ආදරෙයි යේසුනි.. අයි ලව් යූ යේසුනි"